シンハラ語（スリランカ）：ゆうちょ銀行とお取引をされる外国人のお客さまへ

# තැපැල් බැංකුව සමඟ ගනුදෙනු කරන විදේශීය ගනුදෙනුකරුවන් වෙත

■ ගිණුමක් විවෘත කිරීමේ දී, ඔබේ ලිපිනය / නම වෙනස් කිරීමේ දී හෝ නිල මුද්රාව අලුත් කිරීමේ දී, කරුණාකර ඔබේ නේවාසික පදිංචි කාඩ්පත ඉදිරිපත් කරන්න.

ඔබගේ පුරවැසිභාවය, නේවාසික පදිංචි තත්ත්වය, ජපානයේ රැඳී සිටිය හැකි කාලය ආදිය තහවුරු කරගැනීම සඳහා, ඔබගේ නේවාසික පදිංචි කාඩ්පත ඉදිරිපත් කරන්න.

* ඔබේ නේවාසික පදිංචි කාඩ්පත අලුත් කර ඇත්නම්, බැංකු ක්රියා පටිපාටි සිදුකරන විට, කරුණාකර ඒ බව අප හට දැනුම් දෙන්න.

* නේවාසික පදිංචි කාඩ්පතක් නිකුත් කර නොමැති රාජ්ය තාන්ත්රිකයෙකු වැනි අයෙකු නම් මෙය පෙන්වීම අවශ්ය නොවේ.

■ ගිණුමක් විවෘත කිරීමට අයදුම් කරන දින සිට මාස 3ක් ඇතුළත ජපානයේ රැඳී සිටිය හැකි කාලය අවසන් වන්නේ නම්, කරුණාකර ජපානයේ රැඳී සිටිය හැකි කාලය අලුත් කිරීමෙන් පසු එම අයදුම් කිරීම් සිදු කරන්න.

ගිණුමක් විවෘත කිරීමට අයදුම් කරන දින සිට මාස 3ක් ඇතුළත ජපානයේ රැඳී සිටිය හැකි කාලය අවසන් වන්නේ නම්, ඔබගේ ගිණුම විවෘත කල නොහැකි වේ.

ජපානයේ දිගටම රැඳී සිටීමට අදහස් කරන පාරිභෝගිකයින්, ජපානයේ රැඳී සිටිය හැකි කාලය අලුත් කල පසු, කරුණාකර එම අලුත් කල කාලය සහිත නව නේවාසික පදිංචි කාඩ්පත රැගෙන විත් ගිණුමක් විවෘත කිරීම සඳහා අයදුම් කරන්න.

* ජපානයට ඇතුළු වන අවස්ථාවේ තීරණය වූ ජපානයේ රැඳී සිටිය හැකි කාලය මාස 3ක් හෝ ඊට අඩු වී, ඔබට නේවාසික පදිංචි කාඩ්පතක් නිකුත් කර නොමැති නම් ගිණුමක් විවෘත කළ නොහැක.

* නේවාසික පදිංචි තත්ත්වය හෝ ජපානයේ රැඳී සිටිය හැකි කාලය අලුත් කිරීමේ ක්රියාවලියක ඔබ යෙදී සිටී නම්, කරුණාකර එම අලුත් කිරීමෙන් පසු නව නේවාසික පදිංචි කාඩ්පත රැගෙන පැමිණෙන්න.

■ කරුණාකර ඔබේ ශිෂ්ය හැඳුනුම්පත හෝ සේවක හැඳුනුම්පත ආදිය පෙන්වන්න.

ඔබගේ නේවාසික පදිංචි තත්ත්වය “ශිෂ්යය” හෝ “තාක්ෂණික සීමාවාසික පුහුණු” වේ නම්, ගිණුමක් විවෘත කිරීමේ දී ඔබේ ශිෂ්යභාවය හෝ රැකියා තත්වය ආදී කරුණු තහවුරු කර ගැනීම සඳහා, කරුණාකර ඔබේ නේවාසික කාඩ්පත සමඟ ඔබේ ශිෂ්ය හැඳුනුම්පත හෝ සේවක හැඳුනුම්පත ආදිය ඉදිරිපත් කරන්න.

* ඔබගේ අධ්යාපන හෝ රැකියා ස්ථානය හා සම්බන්ධ වී, ඔබ එම ස්ථානයට අයත් බවට තහවුරු කරගන්නා අවස්ථා ඇත.

■ ගිණුමක් විවෘත කිරීමට යම් කාලයක් ගත වන අවස්ථා ඇත.

විදේශිකයෙකු ගිණුමක් විවෘත කිරීම සඳහා ඉල්ලුම් කරන විට, අදාළ නීති සහ රෙගුලාසි ආදිය මත පදනම්ව විවිධ තහවුරු කර ගැනීම් සඳහා කාලය ගතවන බැවින්, එය භාරගත් දිනයේම ගිණුම විවෘත කිරීමට නොහැකි වී, පසු දිනක බැංකුපොත පාරිභෝගිකයාගේ නිවසට තැපැල් කරන අවස්ථා ඇත. මීට අමතරව, ගිණුමක් විවෘත කිරීම ප්රතික්ෂේප කෙරෙන අවස්ථා ද ඇති බව කරුණාවෙන් සලකන්න.

■ <u>සැලකිලිමත් විය යුතු වෙනත් කරුණු</u>

- **<u>ඔබේ නේවාසික පදිංචි කාඩ්පත අලුත් කර ඇත්නම්, කරුණාකර අලුත් කළ කාඩ්පත රැගෙන විත් වහාම කවුන්ටරයට දන්වන්න. දැනුම් දීමක් නොමැති අවස්ථාවල දී, ඔබේ ගනුදෙනු තාවකාලිකව සීමා කිරීමට ඉඩ ඇත.</u>**
- ඔබ ඉදිරිපත් කරන අනන්‍යතා ලේඛනවල පිටපත් ලබා ගනු ලැබේ.
- ඔබව අනේවාසිකයෙකු ලෙස දැනුම් දී තිබේ නම්, සහ අනේවාසිකයෙකු සිට නේවාසික පදිංචිකරුවෙකු ලෙස වෙනස් වී ඇත්නම්, කරුණාකර වහාම කවුන්ටරයට දැනුම් දෙන්න.
- **<u>තම රටට නැවත යෑම ආදිය හෝ ජපානයෙන් පිටත පදිංචියට යන්නේ නම්, කරුණාකර ගිණුම අවලංගු කරන්න.</u>**
- **<u>තෙවන පාර්ශවයකට භාවිතා කිරීම අරමුණු කොටගෙන, ගිණුම (බැංකු පොත / ATM කාඩ්පත) කෙනෙකුට පැවරීම, මිලදී ගැනීම හෝ විකිණීම අපරාධයකි. කිසිසේත්ම එසේ නොකරන්න.</u>**

ඉදිරිපස




පිටුපස




මූලාශ්‍රය: ජපානයේ ආගමන විගමන කාර්යාංශයේ වෙබ් අඩවිය